**ශීර්ෂය 257 - කළුතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

කළුතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව කළුතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2021 ජුනි 18 දින ගණන්දීමේ නිලධාරි වෙත ඉදිරිපත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාල වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2021 ජුනි 17 දින ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට කළුතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දිමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

---------------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේ දී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේ දී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදි. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේ දී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුල දී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදි.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

**ආදායම් නොවන ලැබීම්**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරි අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු වැය ශීර්ෂයන් සඳහා දරන ලද ශුද්ධ වියදම ගණනය කිරීමේ දී අදාළ වැය විෂයන්ට අධිභාර කළ යුතු එකතුව රු.197,877,835 ක් වූ බැර ශේෂ, මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ වෙනත් ලැබීම් ලෙස දක්වා තිබීම හේතුවෙන් ආදායම් නොවන ලැබීම් ශේෂය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි. | ඉදිරියේදී නිවැරදිව සිදු කරන බව දන්වා ඇත. | ආදායම් නොවන ලැබීම් නිවැරදිව හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතු බව. |

### 1.6.2 මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

**දේපල, පිරියත හා උපකරණ**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරි අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) භාණ්ඩාගාර මුද්‍රිත අනුව සමාලෝචිත වර්ෂයේ ආරම්භක දිනට දේපළ, පිරියත හා උපකරණ ශේෂය රු.2,386,595,021 ක් වුව ද මූල්‍ය ප්‍රකාශන අනුව ආරම්භක ශේෂය රු.2,428,280,700 ක් වූයෙන් දේපළ, පිරියත හා උපකරණ ආරම්භක ශේෂයේ රු.41,685,679 ක නොසැසඳීමක් | වෙනස්කම් හඳුනා ගෙන ඇති බවත් වසංගත තත්ත්වය පහව ගිය පසු භාණ්ඩාගාරය සමඟ සම්බන්ධ වී නිවැරදි කර ගැනීමට කටයුතු කරන බව දන්වා ඇත. | ආයතනයේ පොත් අනුව ශේෂ හා භාණ්ඩාගාර පොත් අනුව ශේෂ සසඳා නිවැරදි ශේෂ පදනම් කර ගෙන මූල්‍ය ප්‍රකාශන සකස් කළ යුතු බව. |

| | | |
|---|---|---|
| නිරීක්ෂණය වූ අතර දේපළ, පිරියත හා උපකරණ සංචිත ගිණුමේ ආරම්භක ශේෂයේ ද එම ප්‍රමාණයේ නොසැසඳීමක් විය. | | |
| (ආ) මූල්‍ය තත්ත්වය ප්‍රකාශය අනුව, 2020 දෙසැම්බර් 31 දිනට දේපළ පිරියත හා උපකරණ ශේෂය රු.2,541,892,874 ක් වුව ද භාණ්ඩාගාර මුද්‍රිත අනුව එදිනට ශේෂය රු.2,594,098,708 ක් වූයෙන් සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට දේපළ,පිරියත හා උපකරණ ශේෂයේ රු.52,205,834 ක නොසැසඳීමක් නිරීක්ෂණය වූ අතර දේපළ, පිරියත හා උපකරණ සංචිත ගිණුමේ අවසාන ශේෂයේ ද එම ප්‍රමාණයේ නොසැසඳීමක් විය. | -එම- | -එම- |
| (ඇ) මූල්‍ය ප්‍රකාශනයේ ACA-6 "මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශයේ" 2020 දෙසැම්බර් 31 දිනට දේපළ, පිරියත හා උපකරණ ශේෂය 2,739,406,842 ක් ලෙස දක්වා තිබුණ ද මූල්‍ය තත්ත්වය ප්‍රකාශයේ එම ශේෂය රු.2,541,892,874 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් රු.197,513,967 ක නොසැසඳීමක් නිරීක්ෂණය විය. | මූල්‍ය තත්ත්වය ප්‍රකාශනයේ නිවැරදි අගය දක්වා නොමැති බවත් ඉදිරියේ දී මෙම අඩුපාඩු වලක්වා ගැනීමට නිලධාරීන් දැනුවත් කළ වවත් දන්වා ඇත. | නිවැරදි අගයන් පදනම් කර ගෙන මූල්‍ය ප්‍රකාශන සකස් කළ යුතු බව. |

## 1.6.3 අක් මුදල් ගැලපුම් ගිණුම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරි අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන තොරතුරු අනුව සිදු කළ ගණනය කිරීමේ දී අක් මුදල් ගැලපුම් ගිණුමට ගැලපිය යුතු වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු සඳහා දරන ලද ශුද්ධ වියදම රු.6,607,321,132 ක් වූ වුවත් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් රු.6,805,198,968 ක් වූ දළ වියදම අක් මුදල් ගැලපුම් ගිණුමට ගලපා තිබුණි. | ඉදිරියේ දී අඩුපාඩු සිදු නොවන ලෙසට කටයුතු කිරීමට නිලධාරීන් දැනුවත් කළ බව. | නිවැරදි අගයන් අක් මුදල් ගැලපුම් ගිණුමට ඇතුළත් කළ යුතු බව. |

### 1.6.4 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් පිළිබඳ සැසැඳුම් ප්‍රකාශය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරි අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| කළුතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අදාළ නිලධාරියෙකුගේ වර්ෂයේ අවසානයට ඇති රු.181,570 ක ණය ශේෂය සාමාජික ණය ලේඛනයෙන් අත්හැරී තිබුණි. | ප්‍රමාද දෝෂයකින් මෙම අඩුපාඩු සිදු වී ඇති බවත් ඉදිරියේ දී අඩුපාඩු නොවන ලෙසට කටයුතු කරන බව දන්වා ඇත. | සාමාජික ණය ලේඛන නිවැරදිව පවත්වා ගත යුතු බව. |

### 1.6.5 අග්‍රිම ශේෂය

පහත සඳහන් නිරික්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරි අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත (SA-21) අනුව, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු වෙනුවෙන් දරන ලද වියදම රු.6,813,504,501 ක් වුව ද මූල්‍ය ප්‍රකාශනයේ අග්‍රිම ගැලපුම් ගිණුම තුල එම ශේෂය රු.6,805,198,968 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු වෙනුවෙන් දරන ලද වියදමේ රු.8,305,533 ක නොසැසඳීමක් නිරීක්ෂණය විය. | ඉදිරියේ දී මෙවැනි අඩුපාඩු ඇති නොවීමට නිලධාරීන් දැනුවත් කළ බව දන්වා ඇත. | භාණ්ඩාගාර ශේෂ සමඟ සසඳා නිවැරදි අගයන් පදනම් කර ගෙන මූල්‍ය ප්‍රකාශන සකස් කළ යුතු බව. |
| (ආ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පොත් අනුව භාණ්ඩාගාරයට පියවා ඇති එහෙත් භාණ්ඩාගාර පොත් අනුව 2020 දෙසැම්බර් 31 දිනට නොපිය වූ රු.7,424,361 ක් වූ මාර්ගස්ථ අග්‍රිම ශේෂය මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණි. | ප්‍රමාද දෝෂයකින් මූල්‍ය ප්‍රකාශනවල සටහන් කර නොමැති බව දන්වා ඇත. | මාර්ගස්ථ මුදල් ශේෂය මූල්‍ය ප්‍රකාශනයේ අනාවරණය කළ යුතු බව. |

### 1.6.6 ලේඛන පොත්පත් පවත්වා නොතිබීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරි අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) මුදල් රෙගුලාසි 110 ප්‍රකාරව හානි ලේඛනය යාවත්කාලීන කර නොතිබුණි. | හානි පාඩු ලේඛනය මේ වන විට යාවත් කාලීන කර ඇති බව. | මුදල් රෙගුලාසි 110 ප්‍රකාරව හානි ලේඛනය යාවත්කාලීන කළ යුතු බව. |
| (ආ) මුදල් රෙගුලාසි 214 ප්‍රකාරව බැරකම් පිළිබඳ ලේඛනය යාවත්කාලීන කර නොතිබුණි. | පිළිතුරක් ලබා දී නොතිබුණි. | මුදල් රෙගුලාසි 214 ප්‍රකාරව බැරකම් ලේඛනය යාවත්කාලීන කළ යුතු බව. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරි අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූලධන වැය විෂයක හා පුනරාවර්තන වැය විෂයන් 03 ක් සඳහා ලබා දී තිබුණ එකතුව රු.10,199,000 ක ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.9,282,094 ක් පමණක් උපයෝජනය කර තිබුණ හෙයින් ඉතිරි වීම් රු. 916,905 ක් වූ අතර එම ඉතිරි වීම් ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 7 සිට සියයට 29 ක් දක්වා වූ පරාසයක විය. | නිලධාරීන් විශ්‍රාම යාම, වසංගත තත්ත්වය මත ප්‍රතිපාදන උපයෝජනය අවම වීම, වැය විෂයන්ට අධිභාර කිරීම් සිදු වීම වැනි හේතු මත ප්‍රතිපාදන ඉතිරිවී ඇති බව දන්වා ඇත. | ඇස්තමේන්තු නිවැරදිව සැකසීමටත් ප්‍රතිපාදන කාර්යක්ෂමව උපයෝජනය කිරීමටත් පියවර ගත යුතු බව. |

### 2.2 බැරකම් හා බැඳීම්වලට එළඹීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරි අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) භාණ්ඩාගාර මුද්‍රිත SA-92 සටහන අනුව, සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට බැඳීම් හා බැරකම් ශේෂය රු.2,272,050 ක් වුව ද මූල්‍ය | තවදුරටත් පරීක්ෂා කර බලා පිළිතුරක් ලබා දෙන බව දන්වා ඇත. | භාණ්ඩාගාර පොත් සමඟ සසඳා නිවැරදි තොරතුරු මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කළ යුතු |

| | | |
|---|---|---|
| ප්‍රකාශනවල සටහන් අංක (iv) අනුව එම ශේෂය රු.884,518 ක් වූයෙන් 2020 දෙසැම්බර් 31 දිනට බැදීම් හා බැරකම් ශේෂයේ රු.1,387,532 ක නොසැසඳීමක් නිරීක්ෂණය විය. | | බව. |
| (ආ) මූල්‍ය ප්‍රකාශනවල සටහන් අංක (iv) යටතේ ඇති “බැරකම් හා බැදීම් පිළිබඳ ප්‍රකාශයේ” තොරතුරු ඇතුළත් කිරීමේ දී මුදල් රෙගුලාසි 94(2) ප්‍රකාරව එළඹිය හැකි උපරිම බැදීම් සීමාව සටහන් කළ යුතු වුවත් බැරකම් හා බැදීම් පිළිබඳ ප්‍රකාශයේ එම තොරතුරු ඇතුළත් කර නොතිබුණ බව නිරීක්ෂණය විය. | තොරතුරු ඉදිරිපත් කිරීමේ අඩුපාඩු ඉදිරියේ දී ඇති නොවීමට ක්‍රියාකරන බව දන්වා ඇත. | මූල්‍ය ප්‍රකාශන සටහන් නිවැරදිව හා සම්පූර්ණව ඉදිරිපත් කළ යුතු බව. |

**2.3 ප්‍රධාන ගණන්දීමේ නිලධාරී/ ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්**

**-----------------------------------------------------------------------------------------**

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරී අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයක් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | පාලන පද්ධති නැවත සමාලෝචනය කර තවදුරටත් වැඩි දියුණු කිරීමට සටහන් කර ගත් බව දන්වා ඇත. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව කටයුතු කළ යුතු බව. |

## 2.4 නීති,රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති,රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරි අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| | නීති,රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | | |
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ විධිවිධාන | | | |
| i. | XXIV පරිච්ඡේදයේ 4.4 වගන්තිය | වසර 2 කට හා 3කට පෙර මිය ගිය නිලධාරීන් දෙදෙනෙකුට අදාළ එකතුව රු.371,133 ක ණය ශේෂයක් අදාළ විධිවිධාන ප්‍රකාරව සමාලෝචිත වර්ෂය අවසානයටත් නිරවුල් කර ගෙන නොතිබුණි. | මේ වන විට පවතින රු. 371,133 ක් වූ ණය ශේෂ අය කිරීමේ කටයුතු සිදු කරමින් පවතින බව දන්වා ඇත. | ආයතන සංග්‍රහයේ විධිවිධාන අනුව කටයුතු කළ යුතු බව. |
| ii. | XXIV පරිච්ඡේදයේ 4.2.2, 4.2.4, 4.2.5, 4.5, 4.6 හා 6.3 | නිලධාරියා විශ්‍රාම ගොස් මාස 3-12 හා වසර 2-3 අතර කාලසීමාවක් යන තුරුත් අය කර නොගත් එකතුව රු.280,296 ක ණය ශේෂ 2 ක් පැවතුණි. | මේ වන විට රු. 280,296 ක ණය ශේෂ දෙකක් පවතින අතර ඒවා නිරවුල් කරමින් පවතින බව. | -එම- |
| iii. | XXIV පරිච්ඡේදයේ 4.5 හා 4.6 | විධිවිධාන ප්‍රකාරව කටයුතු කර නිරවුල් කර නොගත් වැඩ තහනම් කරන ලද නිලධාරීන් 5 දෙනෙකුගෙන් අය විය යුතු එකතුව රු.659,913 ක ණය ශේෂයක් විය. | නිලධාරීන් සම්බන්ධයෙන් අධිකරණ කටයුතු පවතින බැවින් නිරවුල් කිරීම් ප්‍රමාද වී ඇති බව. | -එම- |
| iv. | XXIV පරිච්ඡේදයේ 4.5 හා 4.6 වගන්ති | වසර 2කට හෝ ඊට පෙර තනතුර හැර ගිය නිලධාරීන් තුන් දෙනෙකුගෙන් අය විය යුතු එකතුව රු.342,889 ක ණය ශේෂ සමාලෝචිත වර්ෂය අවසානය දක්වාත් විධිවිධාන ප්‍රකාරව කටයුතු කර අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ණය කපා හැරීම හා වාරික වශයෙන් අය කිරීමේ කටයුතු කෙරෙමින් පවතින බව දන්වා ඇත. | -එම- |
| (ආ) | | | තුන්වන පාර්ශවයකින් මුදල් රෙගුලාසි | |

| | | | |
|---|---|---|---|
| මුදල් රෙගුලාසි 109 (1) | පානදුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ 2006 වර්ෂයේ සිදු වූ රිය අනතුරකට අදාළව අය කර ගැනීමේ හැකියාව පැවති රු.97,252 කක් වූ අලාභය ප්‍රාදේශීය ලේකම්ගේ නිර්දේශය මත දිස්ත්‍රික් ලේකම්වරයා විසින් මුදල් රෙගුලාසි විධිවිධානවලට පටහැනිව පොත්වලින් කපා හැරීමට අනුමැතිය ලබා දී තිබුණි. | අලාභය අය කිරීමට අධිකරණ තීරණයක් ලබා දී ඇති බැවින් පසු වපරම් කර අය කරගැනිමට යටත්ව අලාභය කපා හැර ඇති බව දන්වා ඇත. | 109(1) විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු බව. |

**2.5 වංචනික ස්වරූපයේ ගනුදෙනු**

--------------------------------

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරි අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 වර්ෂයේ ක්‍රියාත්මක කළ සපිරිගම ව්‍යාපෘතියේ මාර්ග ඉදිකිරීමේ කර්මාන්ත සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් මුදල් ගෙවීමේ දී මාර්ගයේ ප්‍රමිතිය පිළිබඳ තහවුරුවක් ලබා ගැනීම සඳහා සම්පීඩන ශක්තිය පරීක්ෂණ (Cube test) හා මාර්ග ඝනකම පිළිබඳ පරීක්ෂණ වාර්තා (Core test) මූලික පදනමක් ලෙස යොදා ගෙනතිබුණි. එහෙත් මුදල් ගෙවීම සඳහා පදනම් කර ගත් පර්යේෂණ වාර්තාවල පහත දැක්වෙන පරිදි වෙනස් කිරීම හා වෙනත් අඩුපාඩු පැවතීම හේතුවෙන් ව්‍යාපෘති 141 කට අදාළව එකතුව රු.82,087,610 ක මුදලක් කොන්ත්‍රාත්කරුවන්ට ගෙවා ඇති බව නිරීක්ෂණය විය. | දිස්ත්‍රික්කය තුල පවතින කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් ප්‍රාදේශීය කාර්යාල මඟින් පැහැදිලි කිරීම් ලබා ගැනීම ප්‍රමාද වන බැවින් ඒවා ලද පසු පිළිතුරු ලබා දෙන බව දන්වා ඇත. | විධිමත් පරීක්ෂණයක් සිදු කර වගකිව යුතු පාර්ශව හඳුනා ගැනීමට හා සාවද්‍ය වාර්තා මත ගෙවීම් කිරීම නිසා රජයට සිදු වී ඇති අලාභය ගණනය කර පියවා ගැනීමට කටයුතු කළ යුතු බව. |

| වාර්තාවල පවතින අඩුපාඩු | ප්‍රා.ලේ.කා. ගණන | ව්‍යාපෘති සංඛ්‍යාව |
|---|---|---|
| * පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරියේ හොරණ සහ රත්මලාන රසායනාගාරයෙන් ලබා දුන් අසමත් වාර්තා සමත් ලෙස වෙනස් කර තිබුණ වාර්තා පදනම් කර ගෙන ගෙවීම | 12 | 34 |

| | | |
|---|---|---|
| * රසායනාගාර විසින් නිකුත් කර නොමැති එහෙත් රසායනාගාර නිකුත් කළ ඒවා ලෙස නිර්මාණය කළ පරීක්ෂණ වාර්තා මත ගෙවීම | 01 | 05 |
| * පරීක්ෂණ වාර්තාවල ප්‍රතිඵල අසමත් ව තිබියදීත් ඒ පිළිබඳ අවධානය යොමු කිරීමෙන් තොරව මුදලක් ගෙවා තිබීම | 12 | 69 |
| * පරීක්ෂණ වාර්තා අසමත් අවස්ථා වල දී, පරීක්ෂණ වාර්තා අසමත් බව රසායනාගාරයට නොදන්වා එම රසායනාගාරයෙන්ම දෙවන වරට ලබා ගත් පරීක්ෂණ වාර්තා පදනම් කර ගෙවා තිබීම | 6 | 18 |
| * පරීක්ෂණ වාර්තා අසමත් අවස්ථා වල දී, පරීක්ෂණ වාර්තා අසමත් බව රසායනාගාරයට නොදන්වා වෙනත් රසායනාගාරයකින් දෙවන වරට ලබා ගත් පරීක්ෂණ වාර්තා පදනම් කර ගෙවා තිබීම | 02 | 04 |
| * දින 07 සහ දින 28 ට අදාල සම්පීඩන වාර්තා අසමත් ව තිබිය දී විධිමත තහවුරුවක් ලබා ගත නොහැකි සාම්පල් ලබා දී දින 39 න් ලබා ගත් පරීක්ෂණ වාර්තාක් පදනම් කර ගෙන ගෙවා තිබීම | 01 | 01 |

| | | |
|---|---|---|
| * වාර්තා අසමත් අවස්ථා වල දී ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ කමිටුවක තීරණ මත ප්‍රමිතියෙන් තොර ඉදි කිරීමට අදාළව රඳවා ගැනීම් මුදල් වැඩි කිරීමට පමණක් සිදු කර මුදල් ගෙවා තිබීම | **05** | **07** |
| * රසායනාගාර පරීක්ෂණ වාර්තා ලැබීමට පෙර මුදල් ගෙවා තිබීම | **01** | **03** |
| | | ----- |
| එකතුව | | **141** |
| | | === |

**2.6** තැන්පතු ශේෂයන්
--------------------

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරි අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ---------------------- | ---------------------------- | ----------- |
| සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට පොදු තැන්පත් ගිණුම් 6 ක එකතුව රු.552,583,335 ක ශේෂයක් විය. ඒ අතරින් පොදු තැන්පත් ගිණුම් 5 කට අදාළව වසර දෙකක් ඉක්ම වූ නිරවුල් නොවූ එකතුව රු.209,226,429 ක තැන්පතු ශේෂයක් නිරීක්ෂණය වූ අතර ඒ තුල එකතුව රු.45,848,596 ක් වසර 5 ක් ඉක්ම වූ තැන්පතු ශේෂ බව තවදුරටත් නිරීක්ෂණය විය. මේ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571(3) විධිවිධාන ප්‍රකාරව පවතින අඩුපාඩු හා දෝෂ නිවැරදි කර අදාළ පාර්ශව වෙත තැන්පත් මුදල් ගෙවා දැමීම හෝ රජයේ ආදායමට බැර කිරීමට හෝ විධිමත් පියවර ගෙන නොතිබුණ බව නිරීක්ෂණය විය. | පවතින වසංගත තත්ත්වය හා අග්‍රිම නොලැබීම වැනි හේතු මත නිරවුල් කිරීම් ප්‍රමාද වී ඇති බව දන්වා ඇත. | මුදල් රෙගුලාසි 571 (3) ප්‍රකාරව කටයුතු කළ යුතු බව. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 සැලසුම් කිරීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරි අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර තිබුණ ද 2014 පෙබරවාරි 17 දිනැති අංක 1/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව ඇතුළත් විය යුතු විස්තරාත්මක තොරතුරු ඇතුළත් කර නොතිබුණ බව නිරීක්ෂණය විය. | චක්‍රලේඛය විධිවිධාන පරිදි ඉදිරියේ දී සැලසුම් සකස් කරන බව දන්වා ඇත. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු බව. |

### 3.2 දේශීය අරමුදල් යෙදවූ ව්‍යාපෘති

සපිරි ගමක් ප්‍රජාපාදක ග්‍රාම සංවර්ධන වැඩ සටහන යටතේ කළුතර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 14 ක් තුල ඉදිකිරීම් ව්‍යාපෘති 2,367 ක් සමාලෝචිත වර්ෂයේ දී ක්‍රියාත්මක කර තිබුණ අතර ඒ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

### 3.2.1 ව්‍යාපෘති හඳුනා ගැනීම හා ක්‍රියාත්මක කිරීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරි අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) සපිරි ගමක් ප්‍රජා පාදක ග්‍රාමීය සංවර්ධන වැඩසටහන සඳහා කළුතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට ව්‍යාපෘති 2,390ක් වෙනුවෙන් රු. 1,524,000,000 ක ප්‍රතිපාදන අනුමත වී තිබුණද, ඉන් රු. 1,508,700,000ක් වටිනාකම වූ ව්‍යාපෘති 2,367ක් පමණක් ක්‍රියාත්මක කර තිබුණි. ඒ අනුව, රු. 15,300,000 ක් වටිනාකම වූ ව්‍යාපෘති 23ක් ක්‍රියාත්මක කර නොතිබීම හේතුවෙන් එම මුදල කළුතර දිස්ත්‍රික්කයේ සංවර්ධන කටයුතු සඳහා උපයෝජනය කර නොතිබුණි. | දිස්ත්‍රික්කයතුල පවතින කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් ප්‍රාදේශීය කාර්යාල මඟින් පැහැදිලි කිරීම් ලබා ගැනීම ප්‍රමාද වන බැවින් ඒවා ලද පසු පිළිතුරු ලබා දෙන බව දන්වා ඇත. | ලැබෙන සියලුම ප්‍රතිපාදන දිස්ත්‍රික්කයේ සංවර්ධන කටයුතු සඳහා යෙදවීමට පියවර ගත යුතු බව. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2019 දෙසැම්බර් 6 දිනැති අංක MFEPD/PLAN/RD2020 දරන මුදල් අමාත්‍යාංශ චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව ව්‍යාපෘති හඳුනා ගැනීමේ දී ප්‍රමුඛතාවය ලබා දිය යුතු ක්ෂේත්‍ර 9 ක් ලබා දී තිබුණ ද ප්‍රාදේශීය ලේකම් කාර්යාල 14 විසින් ක්‍රියාත්මක කර ඇති ව්‍යාපෘති 2,367 අතරින් ව්‍යාපෘති 2,284 ක් එනම් සියයට 96.5 ක් ග්‍රාමීය මාර්ග, පඩිපෙළ, බෝක්කු,කුඩා පාලම් හා පැති කාණු යන එක ක්ෂේත්‍රයකට අදාළ ව්‍යාපෘති පමණක් තෝරා ගෙන තිබුණි. ඉතිරි ක්ෂේත්‍ර 8 සඳහාම හඳුනාගෙන තිබුණේ ව්‍යාපෘති 83 ක් පමණක් විය. ඒ අනුව, ව්‍යාපෘති තෝරා ගැනීමේ දී චක්‍රලේඛයෙන් අපේක්ෂිත ආර්ථික සංවර්ධන අරමුණු කෙරෙහි අවධානය යොමු කර ව්‍යාපෘති තෝරා ගැනීමට කටයුතු කර නොතිබුණ බව නිරීක්ෂණය විය. | -එම- | අපේක්ෂිත ආර්ථික සංවර්ධන අරමුණු ලඟා කර ගැනීම සඳහා චක්‍රලේඛ විධිවිධාන පරිදි සියලුම ක්ෂේත්‍ර ආවරණය වන පරිදි ව්‍යාපෘති තෝරාගත යුතු බව |
| (ඇ) | ඉදිකිරීම් ව්‍යාපෘති සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාලය 14 සඳහා වෙන්කළ ප්‍රතිපාදනවලින් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සෘජු අධීක්ෂණය යටතේ කර්මාන්ත 996 ක් ක්‍රියාත්මක කර තිබුණි. ඉතිරි කර්මාන්ත 1,371 ට අදාළ ඇස්තමේන්තු සැකසීම, අධීක්ෂණය කිරීම, බිල්පත් සකසා ගෙවීමට ඉදිරිපත් කිරීම ආදී සියළු කාර්යයන් කළුතර දිස්ත්‍රික්කයේ පළාත් පාලන ආයතන විසින් විසින් සිදුකර තිබුණු අතර එසේ ඉදිරිපත් කරන බිල්පත් සඳහා මුදල් ගෙවීමේ කාර්යය ප්‍රදේශීය ලේකම් විසින් සිදුකර තිබුණි. | -එම- | ගණන්දීමේ නිලධාරියාගේ වගකීම තහවුරුවන පරිදි දිස්ත්‍රික් ලේකම් වෙත ලැබෙන ප්‍රතිපාදන උපයෝජනය කිරීමේ වැඩ පිළිවෙලක් සකස් කර ගත යුතු බව. |
| (ඈ) | ප්‍රතිපාදන උපයෝජනයේ දී දිස්ත්‍රික් ලේකම්වරයා හා ප්‍රාදේශීය ලේකම්වරු ගණන්දීමේ නිලධාරීන් ලෙස කටයුතු කළ ද පළාත් පාලන ආයතන විසින් ක්‍රියාත්මක කළ ව්‍යාපෘතිවල පළාත් පාලන ආයතන සැකසූ ඇස්මේන්තු හා ගෙවීම් සඳහා ඉදිරිපත් කළ බිල් පත් පරික්ෂා කිරීමට ප්‍රාදේශීය ලේකම්වරුන් විසින් පියවර ගෙන නොතිබුණ බවත් | -එම- | ගණන්දීමේ නිලධාරියාගේ වගකීම තහවුරුවන පරිදි දිස්ත්‍රික් ලේකම් වෙත ලැබෙන ප්‍රතිපාදන උපයෝජනය කිරීමේ වැඩ පිළිවෙලක් සකස් කර ගත යුතු බව. |

ඒවා නියාමනය සඳහා අභ්‍යන්තර චක්‍රලේඛ හෝ උපදෙස් මාලාවක් නිකුත් කිරීමට දිස්ත්‍රික් ලෙකම්වරයා කටයුතු කර නොතිබුණ බවත් නිරීක්ෂණය විය.

### 3.2.2 සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ අඩුපාඩු

ප්‍රාදේශීය ලේකම් කාර්යාල 11 ක් විසින් ක්‍රියාත්මක කළ සපිරිගමක් ව්‍යාපෘතිවල ලේඛණ හා වාර්තා පදනම් කර ගෙන සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේ දී අනාවරණය වූ කරුණු පහත වේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරි අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) බස්නාහිර පළාත් නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) විසින් අනුමත මිල ලැයිස්තු අනුව, මාර්ග ඉදිකිරීමේ හැඩයම් වැඩ (Form Work) සඳහා යොදාගත යුතු වර්ග මීටරයක් සඳහා රු.1,335 ක හෝ රු.943 ක මිල වෙනුවට රු.3,351 ක රේටය ඇතුළත් කර ව්‍යාපෘති 162 ක හැඩයම් වැඩ වෙනුවෙන් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 07 ක් විසින් රු.22,351,434 ක් වැඩිපුර යොදා සැකසූ ඇස්තමේන්තු පදනම් කර ගෙන ගෙවීම් කර තිබුණ බව නිරීක්ෂණය විය. විස්තර පහත දැක්වේ. | මේ සම්බන්ධයෙන් නිරීක්ෂණ ලබා දෙන ලෙස අදාළ ප්‍රාදේශීය ලේකම්වරුන් දැනුවත් කර ඇති බවත් නිරීක්ෂණ ලද පසු පිළිතුරු ලබා දෙන බව දන්වා ඇත. | විධිමත් පරීක්ෂාවක් සිදු කර වැඩිපුර ගෙවා ඇති මුදල් අය කර ගැනීමටත් වගකිවයුතු පාර්ශව සම්බන්ධයෙන් නිසි පියවර ගැනීමත් කළ යුතු බව. |

| ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | ක්‍රියාත්මක කර ඇති ව්‍යාපෘති සංඛ්‍යාව | වැඩිපුර ඇස්තමේන්තු කර ගෙවා ඇති මුදල රු. |
|---|---|---|
| වලල්ලාවිට | 08 | 796,004 |
| කළුතර | 63 | 5,999,473 |
| පානදුර | 35 | 6,683,019 |
| මදුරාවල | 21 | 831,593 |
| හොරණ | 12 | 6,683,019 |
| බුලත්සිංහල | 18 | 746,236 |
| සාලින්ද නුවර | 05 | 612,090 |
| | 162 | 22,351,434 |

**(ආ) ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - වලල්ලාවිට**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරි අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මාර්ග කොන්ක්‍රීට් ඇතිරීමේ දී කොන්ක්‍රීට් ඝන මීටරයක් සඳහා ප්‍රවාහන ගාස්තු සහිත අනුමත | මේ සම්බන්ධයෙන් නිරීක්ෂණ ලබා දෙන ලෙස අදාළ | විධිමත් පරීක්ෂාවක් සිදු කර වැඩිපුර ගෙවා ඇති මුදල් අය |

| | | |
|---|---|---|
| මිල රේටය රු. 19,314 ක් වුවත් ඇස්තමේන්තු සැකසීමේ දී එය ප්‍රවාහන ගාස්තු රහිත මිල ලෙස දක්වා, අමතර විෂයක් ලෙස ඝන මීටරයක් වෙනුවෙන් රු.930 බැගින් ප්‍රවාහනය ගාස්තු ඇතුළත් කර සැකසූ ඇස්තමේන්තු මත රු.5,124,709 ක් වැඩිපුර ගෙවා තිබුණ බව නිරීක්ෂණය විය. | ප්‍රාදේශීය ලේකම්වරුන් දැනුවත් කර ඇති බවත් නිරීක්ෂණ ලද පසු පිළිතුරු ලබා දෙන බව දන්වා ඇත. | කර ගැනීමටත් වගකිවයුතු පාර්ශව සම්බන්ධයෙන් නිසි පියවර ගැනීමත් කළ යුතු බව. |

(ඇ) **ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - කළුතර**

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරි අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| සපිරිගම ව්‍යාපෘතියට අදාළ චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව එක් වසමක සංවර්ධන ව්‍යාපෘති සඳහා උපරිම වශයෙන් රු.2,000,000 ක් වෙන් කර තිබුණ ද කළුතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ වසම් දෙකක ප්‍රතිපාදන යොදාගෙන රු.4,000,000 ක් වැය කර 729 ඕ වසමේ පැතිබැම්මක් ඉදිකිරීමේ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කර තිබුණ බව නිරීක්ෂණය විය. | මේ සම්බන්ධයෙන් නිරීක්ෂණ ලබා දෙන ලෙස අදාළ ප්‍රාදේශීය ලේකම්වරුන් දැනුවත් කර ඇති බවත් නිරීක්ෂණ ලද පසු පිළිතුරු ලබා දෙන බව දන්වා ඇත. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව ප්‍රතිපාදන උපයෝජනය කළ යුතු බව. |

(ඈ) **ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - දොඩංගොඩ**
පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරි අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| (i) 2019 වර්ෂයට අදාළ අනුමත මිල ලැයිස්තු අනුව ඉදිකිරීම් කර්මාන්තවලට යොදා ගන්නා මි.මි.37.5 කළුගල් ඝන මීටරයක අනුමත මිල රු.2,400 වෙනුවට ඝන මීටරයක් සඳහා රු.3,134 ක් ඇතුලත් කර ව්‍යාපෘති 115 ක් සඳහා එකතුව රු.1,180,823 ක මුදලක් වැඩිපුර ඇස්තමේන්තු කර ගෙවා තිබුණ බව නිරීක්ෂණය විය. | මේ සම්බන්ධයෙන් නිරීක්ෂණ ලබා දෙන ලෙස අදාළ ප්‍රාදේශීය ලේකම්වරුන් දැනුවත් කර ඇති බවත් නිරීක්ෂණ ලද පසු පිළිතුරු ලබා දෙන බව දන්වා ඇත. | විධිමත් පරීක්ෂාවක් සිදු කර වැඩිපුර ගෙවා ඇති මුදල් අය කර ගැනීමටත් වගකිවයුතු පාර්ශව සම්බන්ධයෙන් නිසි පියවර ගැනීමත් කළ යුතු බව. |
| (ii) ප්‍රාදේශීය ලේකම් බලප්‍රදේශයේ විවිධ ස්ථානවල ක්‍රියාත්මක කළ ව්‍යාපෘති සඳහා 20km ක එකම දුරක සිට ද්‍රව්‍ය ප්‍රවාහනය කළ ලෙස දක්වමින්, ද්‍රව්‍ය ඝන මීටරයක් 20km ක් ප්‍රවාහනය කිරීමට රු.620 ක් බැගින් යොදා | -එම- | අසාමාන්‍ය ඇස්තමේන්තු මත වැඩිපුර ගෙවා ඇති මුදල හඳුනා ගෙන රජයට අයකර ගත යුතු බව හා වගකිවයුතු පාර්ශව සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම කළ යුතු බව. |

ව්‍යාපෘති 115 ක් සඳහා එකතුව රු.1,752,527 ක අසාමාන්‍ය ප්‍රවාහන වියදමක් ඇතුළත් කර ඇස්තමේන්තු සකසා ගෙවීම් කර තිබුණ බව නිරීක්ෂණය විය.

**(ඉ) ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - හොරණ**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරි අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | නියැදි පරීක්ෂාවට අනුව, තාර යොදා නිමකළ මාර්ග 76 ක මාර්ග තලයෙහි පළමුවර වර්ග මීටර් 1 කට ලීටර් 2 ක් වන සේ උණු කරන ලද තාර යොදා නිම කිරීමේ දී චිප් ගල් භාවිතා කර තිබුණ අතර 2019 හා 2020 වර්ෂයේ අනුමත මිල ගණන් අනුව වර්ග මීටරයකට රු.302 ගෙවිය හැකි විය. එහෙත් චිප් ගල් වෙනුට වැලි යෙදීමට 2019 හා 2020 වර්ෂවල අනුමත මිළ ගණන් වන වර්ග මීටරයට රු.329 හා රු.324 මිල ගණන් ඇස්තමේන්තුවට ඇතුලත් කර ව්‍යාපෘති 76 ක් වෙනුවෙන් අධිතක්සේරුගත ඇස්තමේන්තු මත රු.844,196 ක් වැඩිපුර ගෙවා ඇති බව නිරීක්ෂණය විය. | මේ සම්බන්ධයෙන් නිරීක්ෂණ ලබා දෙන ලෙස අදාළ ප්‍රාදේශීය ලේකම්වරුන් දැනුවත් කර ඇති බවත් නිරීක්ෂණ ලද පසු පිළිතුරු ලබා දෙන | විධිමත් පරීක්ෂාවක් සිදු කර වැඩිපුර ගෙවා ඇති මුදල් අය කර ගැනීමටත් වගකිවයුතු පාර්ෂව සම්බන්ධයෙන් නිසි පියවර ගැනීමත් කළ යුතු බව. |
| (ii) | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය බල ප්‍රදේශය තුල මාර්ග 108 ක් කොන්ක්‍රීට් අතුරා තිබුණ අතර ඉන් මාර්ග මාර්ග 78 ක අගල් 5 ක් උසින් 1:2:4 අනුපාතයට කොන්ක්‍රීට් ඇතිරීමට පෙර ABC (Aggregate Base Course) යොදා මාර්ග තලය සකස් කර තිබුණි. ABC සපයා ඇතිරීමට අනුමත මිල ගණන් අනුව ඝන මීටරයක් සඳහා එකතුව රු.3,510 ක මිල යොදා ඇස්තමේන්තු සකසා තිබුණි. මාර්ගය සඳහා යොදාගනා ABC ප්‍රමාණය මාර්ග තලයේ ස්වභාවය අනුව තීරණය | -එම- | අසාමාන්‍ය ඇස්තමේන්තු මත වැඩිපුර ගෙවා ඇති මුදල හඳුනා ගෙන රජයට අයකර ගත යුතු බව හා වගකිවයුතු පාර්ෂව සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම කළ යුතු බව. |

විය යුතු වුවත් කොන්ක්‍රීට් කළ මාර්ග 78 සඳහාම මි.මි. 76 එකම උසින් මාර්ග තලයේ ABC ඇතිරීමේ පදනම ලෙස ගෙන එකතුව රු.3,456,347 ක අසාමාන්‍ය ඇස්තමේන්තු සකසා තිබුණ අතර ඒ පිළිබඳ අවධානය යොමු කිරීමෙන් තොරව ගෙවීම් කර තිබුණ බව නිරීක්ෂණය විය.

**(ඊ) ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - බුලත්සිංහල**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරි අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | ප්‍රාදේශීය ලේකම් කාර්යාල බලප්‍රදේශයේ සපිරිගමක් ව්‍යාපෘතිය යටතේ ඉදිකළ අනෙකුත් කොන්ක්‍රීට් මාර්ගවල උස මීටර් 0.125 ක් වුව ද, දිවලකඩ ඉලුක්මණ්ඩිය මාර්ගය පමණක් මීටර් 0.152 ක උසින් කොන්ක්‍රීට් අතුරා සංවර්ධනය කිරීමට රු.2,000,000 ක් ඇස්තමේන්තු කර තිබුණ අතර ඒ අයුරින් පාරේ ඝනකම වැඩි කිරීමට පදනම් වූ කරුණු විගණනයට ඉදිරිපත් නොවීය. මාර්ගයේ ඝනකම මීටර් 0.125 සිට මීටර් 0.152 දක්වා වැඩි කිරීම හේතුවෙන් කොන්ක්‍රීට් සඳහා ඇස්තමේන්තුගත මුදල රු.296,470 කින් වැඩි වී තිබුණි. මාර්ගය සඳහා 1:2:4 කොන්ක්‍රීට් ඇතිරීමට ඝන මීටර් 86.41 ක් ඇස්තමේන්තු කර තිබුණ ද ගෙවීම් කිරීමේ දී ඝන මීටර් 90.7 වෙනුවෙන් ගෙවා තිබීම හේතුවෙන් ඇස්තමේන්තු ප්‍රමාණයට වඩා කොන්ක්‍රීට් ඝන මීටර් 4 වෙනුවෙන් රු.82,787 ක් ගෙවා තිබුණි. මාර්ගයේ උස සම්බන්ධ පරීක්ෂණ වාර්තා (core test) අනුව මාර්ගයේ උස මීටර් 0.150 ස්ථාන පැවතීමෙන්, ඇස්තමේන්තුගත මීටර් 0.152 ක උස නොතිබියදීත් ව්‍යාපෘතිය වෙනුවෙන් රු.1,980,000 ක් ගෙවා තිබුණ බව නිරීක්ෂණය විය. | මේ සම්බන්ධයෙන් නිරීක්ෂණ ලබා දෙන ලෙස අදාළ ප්‍රාදේශීය ලේකම්වරුන් දැනුවත් කර ඇති බවත් නිරීක්ෂණ ලද පසු පිළිතුරු ලබා දෙන බව දන්වා ඇත. | විධිමත් පරීක්ෂාවක් සිදු කර වැඩිපුර ගෙවා ඇති මුදල් අය කර ගැනීමටත් වගකිවයුතු පාර්ශව සම්බන්ධයෙන් නිසි පියවර ගැනීමත් කළ යුතු බව. |
| (ii) | නියැදි පරීක්ෂාවේ දී අනාවරණය වූ පරිදි කොන්ක්‍රීට් මාර්ග 10 ක ඝනකම පිළිඳ තහවුරු කර ගැනීම සඳහා වන පරීක්ෂණ වාර්තා ලබා ගැනීමට Provisional Sum ලෙස රු.16,000 බැගින් ඇස්තමේන්තු කර තිබුණ අතර මාර්ගයක් වෙනුවෙන් පරීක්ෂණ වාර්තාවක් සඳහා රු.11,613 බැගින් පර්යේෂණ ආයතනයට ගෙවා තිබුණි. පරීක්ෂණ වාර්තා ලබා ගැනීම සඳහා වැඩිපුර මුදල් ඇස්තමේන්තු කර ඉතිරි මුදල අතිරේක නිමකිරීම් ලෙස වෙනත් විෂයයන්ට ඇතුළත් කර ගෙවා තිබුණ බව නිරීක්ෂණය විය. | -එම- | අසාමාන්‍ය ඇස්තමේන්තු සැකසීමට අදාළ වගකිවයුතු පාර්ශව සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම කළ යුතු බව. |

(උ) **ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - පාලින්දනුවර**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරි අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | බස්නාහිර පළාත් නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා) විසින් නිකුත් කළ මාර්ග සම්බන්ධ ලැයිස්තු ගත මිල ලේඛන අනුව 2020 සැප්තැම්බර් 01 දින සිට ඇස්තමේන්තු සැකසීමේ දී 1:2:4 කොන්ක්‍රීට් ඝන මීටරයක් සඳහා රු.18,484 ක් යොදාගත යුතු විය. එහෙත් එම දිනයට පසුව ක්‍රියාත්මක කර තිබුණ ව්‍යාපෘති සඳහා කොන්ක්‍රීට් ඝන මීටරයක් සඳහා රු.19,314 මිල අදාළ කර ගැනීම හේතුවෙන් රු.612,498 ක අධි තක්සේරුගත ඇස්තමේන්තු මත ගෙවීම් කර තිබුණි. | මෙ සම්බන්ධයෙන් නිරීක්ෂණ ලබා දෙන ලෙස අදාළ ප්‍රාදේශීය ලේකම්වරුන් දැනුවත් කර ඇති බවත් නිරීක්ෂණ ලද පසු පිළිතුරු ලබා දෙන බව දන්වා ඇත. | විධිමත් පරික්ෂාවක් සිදු කර වැඩිපුර ගෙවා ඇති මුදල් අය කර ගැනීමටත් වගකිවයුතු පාර්ශව සම්බන්ධයෙන් නිසි පියවර ගැනීමත් කළ යුතු බව. |
| (ii) | පාලින්ද නුවර ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ හල්දොල මාර්ගය යන්ත්‍රානුසාරයෙන් කපා සංවර්ධනය කිරීමේදී යොදා ගත් JCB යන්ත්‍රය සඳහා යනත්‍ර පැය 115.5 ක් වෙනුවෙන් රු.423,975 ක් ගෙවා තිබුණි. විගණනය ඉදිරිපත් වූ ගෙවීම් සඳහා පදනම් කර ගත් ලේඛන පරික්ෂාවේ දී යන්ත්‍රය ධාවනය කළ දිනයන් සඳහන් කර නොතිබීමත් යොදා ගෙන ඇති යන්ත්‍රය ශ්‍රී ලංකා යුධ හමුදාවට අයත් යන්ත්‍රයක් බවත් නිරීක්ෂණය විය. | -එම- | රජයේ සම්පත් අවභාවිතයක් සිදු වී ඇති ද යන්න පිළිබඳ පරික්ෂා කර අදාළ පාර්ෂව සම්බන්ධයෙන් විධිමත් පියවර ගත යුතු බව. |
| (iii) | විගණනයට ඉදිරිපත් වූ තොරතුරු අනුව සිදු කළ පරික්ෂවේ දී ඩෙල්කිට්වත්ත ප්‍රධාන මාර්ගය කොරිපස් දමා කාණු පද්ධතිය සංවර්ධනය කිරීම අරමුණු වී තිබුණ ද ඊට පටහැනිව රු.500,000 ඇස්තමේන්තුවක් යටතේ කාණු කපා මාර්ගය මට්ටම් කිරීම සිදු කර තිබුණ බව නිරීක්ෂණව විය. | -එම- | අරමුණට පරිභාහිව කටයුතු කළ පාර්ෂව සම්බන්ධයෙන් විධිමත් පියවර ගත යුතු බව. |
| (iv) | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය බල ප්‍රදේශයේ තුල මාර්ග 147 ක් කොන්ක්‍රීට් අතුරා තිබුණ අතර ඉන් මාර්ග 94 ක අඟල් 5 ක් උසින් 1:2:4 අනුපාතයට කොන්ක්‍රීට් ඇතිරීමට පෙර ABC (Aggregate Base Course) යොදා මාර්ග තලය සකස් කර තිබුණි. මාර්ගය සඳහා යොදාගන්නා ABC ප්‍රමාණය මාර්ග තලයේ ස්වභාවය අනුව | -එම- | අසාමාන්‍ය ඇස්තමේන්තු මත වැඩිපුර ගෙවා ඇති මුදල හඳුනා ගෙන රජයට අයකර ගත යුතු බව හා වගකිවයුතු පාර්ෂව |

| | | |
|---|---|---|
| තීරණය විය යුතු වුවත් කොන්ක්‍රීට් කළ මාර්ග 94 ක් සඳහා ABC හා කොන්ක්‍රීට් එකම ප්‍රමාණයක් ඇතුළත් කරමින් අසාමාන්‍ය ඇස්තමේන්තු සකසා ඒ මත ගෙවීම් කර තිබුණි. | | සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම කළ යුතු බව. |

(ඌ) ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - ඉංගිරිය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරි අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ---------------------- | -------------------------------- | ----------- |
| නියැදි පරීක්ෂාවට අනුව, තාර යොදා නිමකළ මාර්ග 13 ක මාර්ග තලයෙහි පළමුවර වර්ග මීටර් 1 කට ලීටර් 2 ක් වන සේ උණු කරන ලද තාර යොදා නිම කිරීමේ දී චිප් ගල් භාවිතා කර තිබුණ අතර අනුමත මිල ගණන් අනුව ඒ සඳහා වර්ග මීටරයකට රු.302 ක් ගෙවිය හැකි විය. එහෙත් චිප් ගල් වෙනුට වැලි යෙදීමට අනුමත මිළ වන වර්ග මීටරයට රු.329 ඇස්තමේන්තුවට ඇතුලත් කර ව්‍යාපෘති 13 වෙනුවෙන් අධිතක්සේරුගත ඇස්තමේන්තු මත රු.198,418 ක් වැඩිපුර ගෙවා තිබුණ බව නිරීක්ෂණය විය. | මේ සම්බන්ධයෙන් නිරීක්ෂණ ලබා දෙන ලෙස අදාළ ප්‍රාදේශීය ලේකම්වරුන් දැනුවත් කර ඇති බවත් නිරීක්ෂණ ලද පසු පිළිතුරු ලබා දෙන බව දන්වා ඇත. | විධිමත් පරීක්ෂාවක් සිදු කර වැඩිපුර ගෙවා ඇති මුදල් අය කර ගැනීමටත් වගකිවයුතු පාර්ෂව සම්බන්ධයෙන් නිසි පියවර ගැනීමත් කළ යුතු බව. |

(එ) ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - බණ්ඩාරගම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරි අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ---------------------- | --------------------------- | ----------- |
| (i) මාර්ග ඉදිකිරීම් කර්මාන්තවල හැඩයම් වැඩ සඳහා ඇස්තමේන්තු සැකසීමේ දී නිවැරදි නොවූ රේටයක් යොදා ගැනීම නිසා ව්‍යාපෘති 13 කට අදාළව අධිතක්සේරුගත ඇස්තමේන්තු මත රු.1,770,939 ක් වැඩිපුර ගෙවා තිබුණ බව නිරීක්ෂණය විය. | මේ සම්බන්ධයෙන් නිරීක්ෂණ ලබා දෙන ලෙස අදාළ ප්‍රාදේශීය ලේකම්වරුන් දැනුවත් කර ඇති බවත් නිරීක්ෂණ ලද පසු පිළිතුරු ලබා දෙන බව දන්වා ඇත. | විධිමත් පරීක්ෂාවක් සිදු කර වැඩිපුර ගෙවා ඇති මුදල් අය කර ගැනීමටත් වගකිවයුතු පාර්ෂව සම්බන්ධයෙන් නිසි පියවර ගැනීමත් කළ යුතු බව. |
| (ii) 2020 සැප්තැම්බර් 01 දිනෙන් පසුව ක්‍රියාත්මක කර තිබුණ ව්‍යාපෘති 16 ක් සඳහා කොන්ක්‍රීට් සඳහා ඇස්තමේන්තු කිරීමේ දී ඝනමීටරයක් වෙනුවෙන් නිවැරදි නොවූ රේටයක් යොදා ගෙන තිබීම නිසා අධිතක්සේරුගත ඇස්තමේන්තු මත රු.278,082 ක් වැඩිපුර ගෙවා තිබුණ බව නිරීක්ෂණය විය. | -එම- | -එම- |

| | | | |
|---|---|---|---|
| (iii) | කොන්ක්‍රීට් මාර්ගවල ඝනකම පිළිඳ තහවුරු කර ගැනීම සඳහා වන පරීක්ෂණ වාර්තා ලබා ගැනීමට Provisional Sum යටතේ එක් පරීක්ෂණ වාර්තාවක් සඳහා රු.6,000 බැගින් ඇස්තමේන්තු කර තිබුණ ද ලැයිස්තු ගත මිල ලේඛන අනුව අනුමත මිල රු.4,645 ක් වූයෙන් ව්‍යාපෘති 114 ක් වෙනුවෙන් රු.475,605 ක් වැඩිපුර ඇස්තමේන්තු කර තිබුණ බව නිරීක්ෂණය විය. | -එම- | -එම- |

**(ඒ) ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - බේරුවල**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරි අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ---------------------- | ----------------------- | ----------- |
| (i) | ඇස්තමේන්තු සැකසීමේ දී නිලධාරීන් ඒවා සැකසූ දිනය දක්වා නොතිබුණ අතර තාක්ෂණික නිලධාරියෙකු විසින් පරීක්ෂා කිරීම ද සිදු කර නොතිබුණි. ඒ අනුව, 2020 සැප්තැම්බර් 01 දිනෙන් පසුව ක්‍රියාත්මක කර තිබුණ ව්‍යාපෘති 47 ක 1:2:4 කොන්ක්‍රීට් විෂයයේ ඝනමීටරයක් සඳහා නිවැරදි නොවූ රේටයක් යොදා ගෙන තිබීම හේතුවෙන් එකතුව රු.748,411 ක අධිතක්සේරුගත ඇස්තමේන්තු සකසා තිබුණ බව නිරීක්ෂණය විය. | මේ සම්බන්ධයෙන් නිරීක්ෂණ ලබා දෙන ලෙස අදාළ ප්‍රාදේශීය ලේකම්වරුන් දැනුවත් කර ඇති බවත් නිරීක්ෂණ ලද පසු පිළිතුරු ලබා දෙන බව දන්වා ඇත. | විධිමත් පරීක්ෂාවක් සිදු කර වැඩිපුර ගෙවා ඇති මුදල් අය කර ගැනීමටත් වගකිවයුතු පාර්ෂව සම්බන්ධයෙන් නිසි පියවර ගැනීමත් කළ යුතු බව. |
| (ii) | ඇස්තමේන්තුවල වැඩ විෂයයට අදාළ මිල රේටයන් ඇතුළත් කිරීමේ දී ඒ සඳහා පදනම් කර ගත් ලැයිස්තුගත මිල ලේඛණය හා එහි කේත අංකය ඇතුළත් කිරීමට නිලධාරීන් කටයුතු කර නොතිබුණි. ඒ අනුව, ඇස්තමේන්තු සකස් කිරීමේ දී ව්‍යාපෘති 80 ක කැනීම් කටයුතු සඳහා ඝන මීටරයකට රු.1,736.75 ක් හා ව්‍යාපෘති 26 ක එකතුවන ජලය ඉවත් කිරීමට එක් දිනකට රු.4,440 ක් බැගින් වූ මිල රේටයන් යොදා ගැනීමේ පදනම විගණනයට අනාවරණය නොවීය. | -එම- | -එම- |

## 3.3 පාඩු හා හානි

----------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරි අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | දොඩංගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය 1989 වර්ෂයේ දී ගිනිතබා විනාශ කිරීමෙන් සිදු වී ඇති රු.1,465,525 ක අලාභය මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර අයකර ගැනීමට හෝ පොත්වලින් ඉවත් කිරීමට 2020 දෙසැම්බර් 31 දක්වාත් කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි 109 ප්‍රකාර ආකෘතිය 2021 මැයි 4 දින ස්වදේශකටයුතු අමාත්‍යාංශයට ඉදිරිපත් කර ඇති බව දන්වා ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර කඩිනමින් නිරවුල් කළ යුතු බව. |
| (ආ) | මතුගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් වාහනයක් 2015 වර්ෂයේ දී අනතුරකට ලක් වීමෙන් සිදු වී ඇති රු.1,271,169 ක අලාභය 2020 දෙසැම්බර් 31 දක්වා නිරවුල් වී නොතිබුණ බව නිරීක්ෂණය විය. | මේ වන විට අලාභය පොත්වලින් ඉවත් කර ඇති බව දන්වා ඇත. | -එම- |
| (ඇ) | කෝවිඩ් වසංගතය සමයේ සමෘද්ධිලාභී පවුල් සඳහා මැයි මාසයේ රු.5000 දීමනාව ගෙවීමේ දී 2020 මැයි 12 දිනැති අංක MF/NB/CM/91/2020/124/05 දරන මුදල් ආර්ථික හා ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංවරයා ඉදිරිපත් කළ අමාත්‍ය මංඩළ සංදේශය පරිදි සමෘද්ධි සහනාධාර මුදල හා රු.5,000 අතර වෙනස පමණක් ගෙවිය යුතු විය. එහෙත් නියැදි පරික්ෂාවේ දී අනාවරණය වූ පරිදි කළුතර,බේරුවල හා පානදුර ප්‍රාදේශීය ලේකම් කර්යාල විසින් ප්‍රතිලාභීන් 25,390 කට මැයි මාසයේ දී දීමනා දෙකම ගෙවීම හේතුවෙන් එකතුව රු.57,595,640 ක් වැඩිපුර ගෙවා තිබුණ බව නිරීක්ෂණය විය. | 2020/05/10 දිනැති අංක DSD/HO/DG දරන සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තු චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කර ඇති බව දන්වා ඇත. | අමාත්‍ය මංඩළ තීරණ පරිදි කටයුතු කළ යුතු බව. |
| (ඈ) | කුඩා පයාගල අම්බේගම සිට මුහුදට ජලය බැසයාමේ කාණු පද්ධතිය සකස් කිරීමේ ව්‍යාපෘතියට අදාළ ස්ථිර නාම පුවරුවක් සවි කිරීම සඳහා ඇස්තමේන්තුගත පරිදි රු.40,000 ක් කොන්ත්‍රාත්කරුට ගෙවා තිබුණ ද නාම පුවරුවක් සවිකර නොතිබුණ බව නිරීක්ෂණය විය. | නාම පුවරුව සඳහා ගෙවා ඇති මුදල නැවත රජයට ගෙවන ලෙස කොන්ත්‍රාත් කරුට දන්වා යවා ඇති බව වාර්තා කර ඇත. | වැඩිපුර ගෙවා ඇති මුදල් අය කර ගැනීමටත් වගකිවයුතු පාර්ෂව සම්බන්ධයෙන් නිසි පියවර ගැනීමත් කළ යුතු බව. |

## 3.4 විගණන විමසුම්වලට පිළිතුරු ලබා දීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරි අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත නිකුත් කරන ලද විගණන විමසුම් 13 ක් සඳහා 2021 මැයි 31 දිනටත් පිළිතුරු එවා නොතිබුණි. | දිස්ත්‍රික්කය තුල පවතින කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් ප්‍රාදේශීය කාර්යාල මඟින් පැහැදිලි කිරීම් ලබා ගැනීම ප්‍රමාද වන බැවින් ඒවා ලද පසු පිළිතුරු ලබා දෙන බව දන්වා ඇත. | විගණන විමසුම් සඳහා කාලීනව පිළිතුරු ලබා දිය යුතු බව. |

## 3.5 කළමනාකරණ දූර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරි අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) කළුතර දිස්ත්‍රික්කයට අයත් ප්‍රාදේශිය ලේකම් කාර්යාල බලප්‍රදේශ 13 ක් තුළ ස්භාවික ආපදා වලින් පූර්ණ හානියට පත් වන සහ ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය විසින් අධි අවදානම් නිසා ඉවත් කලයුතු ලෙස හඳුනාගත් පවුල් සඳහා "නිවසට නිවසක්" සංකල්පය මත පහත වගුවේ දැක්වෙන පරිදි නිවාස 879 ක් තැනීමට 2017 වර්ෂයේ සිට 2020 දෙසැම්බර් 31 දක්වා ලැබී ඇති රු.1,363,413,225 ක ප්‍රතිපාදන අතරින් 2020 දෙසැම්බර් 31 දිනට ප්‍රතිලාභීන්හට ඉන් රු.929,986,597 ලබා දී තිබුණි. එහෙත් ඉලක්ක ගත නිවාස සංඛ්‍යාවෙන් 606 ක් පමණක් සම්පූර්ණයෙන්ම නිම කර තිබුණ අතර ප්‍රතිලාභීන් ලවා නිවාස 273 ක් නිම කරවා ගැනීමට නිලධාරීන් අපොහොසත් වී තිබුණ බව නිරීක්ෂණය විය. | දිස්ත්‍රික්කය තුල පවතින කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් ප්‍රාදේශීය කාර්යාල මඟින් පැහැදිලි කිරීම් ලබා ගැනීම ප්‍රමාද වන බැවින් ඒවා ලද පසු පිළිතුරු ලබා දෙන බව දන්වා ඇත. | අවදානම් සහිත පුද්ගයන් සුරක්ෂිත ස්ථානවල පදිංචි කිරීමේ කටයුතු කඩිනමින් සුදු කළ යුතු බව. |

| ප්‍රතිලාභ වර්ගය | ප්‍රතිලාභී පවුල් සංඛ්‍යාව | නිම කර ඇති නිවාස සංඛ්‍යාව | නිම කර නොමැති නිවාස සංඛ්‍යාව |
|---|---|---|---|
| i. රජයෙන් ලබාදුන් ඉඩමක නිවසක් ඉදිකිරීමට රුපියල් 1,200,000 ක් ලබාදීම | 355 | 305 | 50 |

| | | | | |
|---|---|---|---|---|
| ii. | ප්‍රතිලාභියා මිලදී ගත් ඉඩමට රු.400,000 ක් සහ එම ඉඩමේ නිවසක් ඉදිකිරීමට රු.1,200,000 ක් ලබාදීම | 267 | 128 | 139 |
| iii. | නිවාස හානි වූ ප්‍රතිලාභීන් විසින් තමන්ට හිමි වෙනත් ආරක්ෂිත ස්ථානයක නිවසක් ඉදිකිරීමට රු. 1,200,000 ලබාදීම | 135 | 63 | 72 |
| iv. | නිවසක් සහිත ඉඩමක් මිලදී ගැනීම වෙනුවෙන් රු.1,600,000 ක් ලබාදීම | 122 | 110 | 12 |
| | **එකතුව** | **879** | **606** | **273** |

| | | | |
|---|---|---|---|
| (ආ) | සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන් හා ප්‍රාදේශීය ලේකම්වරුන් අමතමින් දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා විසින් එවා ඇති 2019 මැයි 14 දිනැති අංක SEC/2029/02 මුද්දර ගාස්තු චක්‍රලේඛය ප්‍රකාරව, විදේශීය මත්පැන් බලපත්‍ර සමඟ නිකුත් කරන AFL1 ,AFL2 ,AFL3 හා AFL4 යන අරක්කු බල පත්‍ර හා බෝතල් රා බල පත්‍ර සඳහා 2006 වර්ෂයේ සිට අය කළ යුතු හිඟ මුද්දර ගාස්තු පවතී නම් ඒවා අයකර දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත ප්‍රේෂණය කළ යුතු විය. එහෙත් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 10 ක් විසින් මත්පැන් බල පත්‍ර නිකුත් කිරීම මත අය විය යුතු එකතුව රු.21,534,500 ක හිඟ මුද්දර ගාස්තුවක් බලපත්‍රලාභින් ගෙන් අය කර ගැනීමට 2020 දෙසැම්බර් 31 දින දක්වාත් පියවර ගෙන නොතිබුණ බව නිරීක්ෂණය විය. | දිස්ත්‍රික්කය තුල පවතින කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් ප්‍රාදේශීය කාර්යාල මඟින් පැහැදිලි කිරීම් ලබා ගැනීම ප්‍රමාද වන බැවින් ඒවා ලද පසු පිළිතුරු ලබා දෙන බව දන්වා ඇත. | හිඟ මුද්දර ගාස්තු කඩිනමින් අය කර දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා වෙත ප්‍රේෂණය කළ යුතු බව. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ විශ්‍රාම වැටුප් ගෙවීම සම්බන්ධයෙන් තොරතුරු කැඳවීමේ දී මතුගම, බේරුවල හා මදුරාවල ප්‍රාදේශීය ලේකම් කාර්යාල 2021 මැයි 10 දක්වාත් එම තොරතුරු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. තොරතුරු ඉදිරිපත් කරන ලද ප්‍රාදේශීය ලේකම් කාර්යාල 11 අතරින් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 4 ක විශ්‍රාමිකයන් 70 දෙනෙකු සඳහා ස්ථිර හෝ තාවකාලික විශ්‍රාම වැටුප් ලිපි ගොනුවක් නොමැතිව විශ්‍රාම වැටුප් ගෙවමින් පවතින බව නිරීක්ෂණය වූ අතර සමාලෝචිත වර්ෂයේ දී පමණක් එකතුව රු.12,252,253 ක මුදලක් එසේ ගෙවා තිබුණි. ඒ අනුව, ස්ථිර හෝ තාවකාලික විශ්‍රාම වැටුප් ලිපි ගොනු | -එම- | විගණනය වෙත තොරතුරු ලබා දීමට ප්‍රාදේශීය ලේකම් කාර්යාල දැන්වත් කිරීමටත් ගොනු නොමැති විශ්‍රාමිකයන් සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂාවක් සිදු කර වැරදි ගෙවීම් වලක්වා ගැනීමේ පාලන ක්‍රම |

| | | |
|---|---|---|
| නොමැතිව විශ්‍රාම වැටුප් ගෙවීමේ දී වැරදි, වංචා හෝ අක්‍රමිකතා සිදු වීම වලක්වා ගැනීමට අනුගමනය කළ යුතු විධිමත් ක්‍රමවේද හඳුන්වා දීමට කළමනාකරණය විසින් කටයුතු කර නොතිබුණි. | | හඳුන්වා දීමත් කළ යුතු බව. |
| (ඇ) 2020 වර්ෂයේ කොවිඩ් වසංගතය හේතුවෙන් අඩු ආදායම්ලාභී පවුල් සඳහා රු.5,000 ක දීමනාව ලබා දීමේ දී ප්‍රාදේශීය ලේකම් කාර්යාල 4 ක තෝරාගත් වසම් 4 කට අදාළව සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේ දී අයදුම්පත් නිකුත් කිරීම, භාරගැනීම හා ලේඛන පවත්වා ගෙන යාම විධිමත් පරිදි සැලසුම්ගතව සිදුකර නොතිබුණ අවස්ථා පැවතීමත් මුදල් ගෙවන අවස්ථාවේ දී ප්‍රතිලාභී නාම ලේඛණ ප්‍රාදේශීය ලේකම්වරු විසින් අනුමත කර නොතිබුණ අවස්ථා පැවතීමත් නිරීක්ෂණය විය. | -එම- | ප්‍රතිලාභ ලබා දීමට අදාළව නිකුත් කළ චක්‍රලේඛ, උපදෙස් හා මාර්ගෝපදේශ ප්‍රකාරව විධිමත් සැලසුමක් යටතේ ප්‍රතිලාභ ගෙවිය යුතු බව. |

**4.** **තිරසර සංවර්ධන අරමුණු ලඟාකර ගැනීම**

-------------------------------------------------

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරි අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ---------------------- | ---------------------------------- | ----------- |
| දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් 2030 තිරසාර සංවර්ධන න්‍යාය පත්‍රයේ අරමුණු 17 ක් යටතේ සංවර්ධන ක්‍රියාකාරකම් හඳුනාගෙන තිබුණ ද සමාලෝචිත වර්ෂයේ දී ප්‍රාදේශීය ලේකම් කාර්යාල 14 විසින් සංවර්ධන ව්‍යාපෘති තෝරා ගැනීමේ දී තිරසර සංවර්ධන න්‍යාය පත්‍රයේ අරමුණු හා ක්‍රියාකාරකම් පිළිබඳ විධිමත් අවධානයක් යොමු කර නොතිබුණ බව නිරීක්ෂණය විය. | ප්‍රාදේශීය ලේකම් කාර්යාල මඟින් සිදු කරන ව්‍යාපෘතිවලින් තිරසර අරමුණුවලට අදාළ බොහෝ කාර්යයන් සිදුවන බව වාර්තා කර ඇත. | 2030 තිරසාර සංවර්ධන න්‍යාය පත්‍රය ප්‍රකාරව කටයුත කළ යුතු බව. |

**5.** **මානව සම්පත් කළමනාකරණය**

-----------------------------------

**පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරි අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ---------------------- | ---------------------------- | ----------- |
| (අ) 2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ ඇමුණුම 2 ආකෘතිය ප්‍රකාරව 2020 වර්ෂය වෙනුවෙන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සඳහා පිළියෙල කළ මානව සම්පත් සැලැස්ම විගණනයට ඉදිරිපත් නොවීය. | චක්‍රලේඛය ප්‍රකාරව ඉදිරියේ දී කටයුතු කරන බව වාර්තා කර තිබුණි. | චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු බව. |

| | | |
|---|---|---|
| (ආ) සමාලෝචිත වර්ෂය සඳහා පුහුණු සැලැස්මක් සකස් කර තිබුණ ද යථෝක්ත චක්‍රලේඛයේ දක්වා ඇති විධිවිධාන ප්‍රකාරව සකස් කර නොතිබුණ අතර චක්‍රලේඛය ප්‍රකාරව සමස්ථ කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්යසාධන ගිවිසුම් අත්සන් කර තිබුණ බව විගණයට නිරීක්ෂණය නොවීය. | -එම- | -එම- |